# XVIII පරිච්ඡේදය

## සාමාන්‍ය හැසිරීම සහ විනය

1. සාමාන්‍ය හැසිරීම
2. කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ශ්‍රමය, දේපළ සහ අරමුදල් භාවිතා කිරීම
3. දායක මුදල් එකතු කිරීම
4. ණය බර නිසා ඇතිවන අපහසුතාවය
5. රාජකාරි තොරතුරු මහජනයාට සැපයීම
6. මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම

# XVIII පරිච්ඡේදය

## සාමාන්‍ය හැසිරීම සහ විනය

1. **සාමාන්‍ය හැසිරීම**

1.1 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු සෑම තැනැත්තෙකුම, තමන් සේවය කරන කොමිෂන් සභාවට/ උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට, තම නොවක් පක්ෂපාතිත්වය දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කොමිෂන් සභාවට සහ උසස් අධ්‍යාපන ආයතනයන්ට පාක්ෂිකභාවය

1.2 කොමිෂන් සභාවට/ උසස් අධ්‍යාපන ආයතනයට/ විද්‍යායතනයකට අනුයුක්තව සේවය කරන සෑම තැනැත්තෙකුම, තමන් හට පවරණු ලබන කාර්යයන් අනලස්ව සහ කාර්යක්ෂම ඉටු කළ යුතු ය.

පැවැරුණු රාජකාරි ඉටුකිරීම

1.3 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු සියළුම තැනැත්තන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ එහි සංශෝධන, නියෝග, නියමාවලි, රීති සහ රෙගුලාසි ආදියෙහි දක්වා ඇති විධි විධාන ද, මෙම සංග්‍රහයෙහි නියමයන් ද, කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් වරින් වර නිකුත් කරනු ලබන්නා වූ විධානයන් පිළිබඳව ද, මනා දැනුමක් සහ අවබෝධයක් ඇති කරගත යුතු වේ.

පනත සහ අනෙකුත් උචිත සාධන පත්‍ර ගැන දැනුම

1.4 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන් සෑම විටම, තමන් සේවය කරන ආයතනයට සහ දරන තනතුරට යෝග්‍ය වන ආකාරයෙන් කටයුතු කළ යුතු ය.

අයතනයේ සහ දරන තනතුරේ කීර්තිය ආරක්ෂා කර ගැනිම

1.4.1 එබඳු තැනැත්තෙකු විසින්, කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයකට / විද්‍යායතනයකට හෝ තමන් දරන තනතුරට අගෞරවයක් වන ආකාරයේ කාර්යයක් සිදුකොට ඇත්නම් එම කරුණු ප්‍රමාදයකින් තොරව, කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාට වාර්තා කළ යුතු ය.

1.5 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තකු, එකී ආයතනය අපකීර්තියට පත්වන ආකාරයේ තමාගේ පෞද්ගලික අවශ්‍යතාවයන් ආයතනයේ හෝ තමන් දරන තනතුර සමඟ ගැටෙන හෝ කෙළින්ම බලපාන බවට පෙනීයන කිසිඳු කටයුත්තක නොයෙදිය යුතු ය.

අවශ්‍යතාවයන් සමඟ ගැටුම

1.6 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක පත් කිරීමක් , උසස් කිරීමක්, ස්ථාන මාරු කිරීමක් ආදී කටයුත්තක් සම්බන්ධයෙන් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් උදව්වක් පතා අය ද සිටීම, එකී තැනැත්තා හට

පත්වීම් / උසස් වීම් / ස්ථාන මාරු සඳහා උදව් පැතීම

විනායානුකූලව ක්‍රියාකළ හැකි අවිනය ක්‍රියාවක් ලෙස සැළකේ. එපරිද්දෙන් කටයුතු කිරීම, අදාල තැනැත්තා හට තමා අයදුම් කළ තනතුර / උසස් වීම අහිමි වීම සහ ස්ථාන මාරුවක් නම් එය අවලංගු විමට ද හේතු විය හැකි ය.

**විනීත බව**

1.7 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු සෑම තැනැත්තෙකුම, තමන් සේවය කරන ආයතනය වෙත හෝ රාජකාරී ස්ථානය වෙත යම් සේවයක් බලාපොරොත්තුවෙන් පැමිණෙන සෑම තැනැත්තෙකු හටම විනීතව ආමන්ත්‍රණය කළයුතු අතර, එම තැනැත්තන් බලාපොරොත්තු වන සේවය අනවශ්‍ය ප්‍රමාද කිරීම් වලින් තොරව සළසා දිය යුතු ය. ඔවුන් රාජකාරී ලිපිගනුදෙනු කිරිමේදී ද විනීත විය යුතු ය.

**භාෂාව සංයමයෙන් යුතු විම**

1.7.1 ඔවුන් රාජකාරි ලිපි, කාර්යාල සටහන් සහ රැස්වීම් වාර්තා සකස් කරන විට, යොදාගන්නා භාෂාව සංයමයෙන් යුතු සහ සංවරශිලි එකක් විය යුතු වේ.

**පෞද්ගලික තත්ත්වයෙන් නඩු මතට පිවිසිම**

1.8 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු විසින්, අදාල පරිදි තමා සේවයේ යෙදී සිටින කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයාගේ / විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක අධ්‍යක්ෂවරයාගේ / උසස් අධ්‍යාපන ආයතනයක, මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයාගේ පූර්ව අවසරයකින් තොරව, සිය රාජකාරී ඉටුකිරීමේදී පැන නැගුන කරුණක් සම්බන්ධයෙන් සිය පුද්ගලික මට්ටමින් නිතී මාර්ගයෙන් කටයුතු කිරීමට පියවර නොගත යුතු ය. කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උපකුලපතිවරයා හෝ අධ්‍යක්ෂවරයා හෝ එවැනි අවසරයක් දීමට පෙර අවශ්‍ය නීතී උපදෙස් ලබා ගත යුතු ය. මණ්ඩපයක / ආයතනයක පැන නගින එවැනි ගැටළු සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා දීම පිණිස, එම මණ්ඩපය / ආයතනය අනුබද්ධිතව / අනුයුක්තව තිබෙන විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට වාර්තා කළ යුතු වේ.

**දණ්ඩ නීතී සංග්‍රහය**

1.9 දණ්ඩ නීතී සංග්‍රහයේ අවශ්‍යතාවයන් සඳහා, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු සියළුම තැනැත්තන්, රජයේ සේවකයින් ලෙස සළකනු ලැබේ.

**අල්ලස් පනත**

1.10 අල්ලස් පනත යටතට ගැනෙන "නම් කල ආයතනයක්" යන්නට, කොමිෂන් සභාව සහ ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් ඇතුලත් වේ.

## 2. කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක කම්කරු ශ්‍රමය, දේපළ සහ අරමුදල් පරිහරණය කිරිම

**කම්කරු ශ්‍රමය සහ දේපළ පරිහරණය කිරිම**

2.1 කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයාගේ, විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයාගේ හෝ විශේෂ අනුමැතිය ඇති ව, ඔවුන් විසින්

තමන් යටතේ සේවය කරන කම්කරුවන් සහ ආයතනයේ දේපළ සම්බන්ධයෙන් නිශ්චය කරනු ලැබූ නියමයන් සහ කොන්දේසි මත මිස, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු කිසිදු තැනැත්තකු විසින්, එම ආයතනයෙහි සේවය කරන කම්කරුවන් රාජකාරී වේලාව තුල දී හෝ ඉන් පිටත දී හෝ එමෙන් ම පෞද්ගලික කටයුතු වලට යොදා නොගත යුතු ය. එසේම, ආයතනය සතු කිසිඳු දේපළක් ද සිය පෞද්ගලික පරිහරණය සඳහා යොදා නොගත යුතු ය. විශ්වවිද්‍යාලයකට අනුබද්ධිතව / අනුයුක්තව ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක මෙවැනි කරුණක් මතු වුවහොත්, ඒ පිළිබඳව තීරණයක් ගැනීම සඳහා අදාල විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වාර්තා කළ යුතු වේ.

2.2 කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයාගේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක අධ්‍යක්ෂවරයාගේ විශේෂ අනුමැතියක් යටතේ මිස, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු කිසිඳු තැනැත්තෙකු විසින්, කොමිෂන් සභාවට හෝ විශ්වවිද්‍යාලයට හෝ විශ්වවිද්‍යාල විද්‍යායතනයට භාණ්ඩ සැපයීම හෝ ආදර්ශ (Sample) විකිණීම ආදිය නො කළ යුතු ය. විශ්වවිද්‍යාලයකට අනුබද්ධිත / අනුයුක්ත වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක එවැනි කරුණක් මතු වූ අවස්ථාවක දී, එකී අවස්ථාවට උචිත පරිදි නිගමනය කිරීම සඳහා අදාල විශ්වවිද්‍යාලන්හි උපකුලපතිවරුන් හට වාර්තා කළ යුතු ය.

භාණ්ඩ සැපයීම සහ "ආදර්ශ" විකිණීම

2.3 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයකට අයිති මුදල්, එහි සරප්/ මුදල් අයකැමිවරයකුගෙන් ඔවුන්ගේ සහකාරවරයකුගෙන් ණයට ඉල්ලා සිටීම සම්පූර්ණයෙන් තහනම් වේ. එවැනි කරුණු, දණ්ඩ නීති සංග්‍රහයට අනුව දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස ගැනේ.

සරප්වරුන්ගේ / අයකැමිවරුන්ගෙන් මුදල් ණයට ගැනීම

2.4 අනුමත නොවූ අත්තිකාරම් ගෙවීම, කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට / විද්‍යායතනයකට අයත් මුදල් ණයට දීම, එම මුදල් උපයෝගී කරගනිමින් පෞද්ගලික චෙක්පත් මාරු කිරීම ආදි කටයුතු සරප්වරුන් සහ මුදල් අයකැමිවරුන්ට සපුරා තහනම් ය.

අනුමත නොවන ගෙවීම්

2.5 කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයකට / විද්‍යායතනයකට අයත් මුදල්, කොපමණ කෙටි කාලයකට වුවද, පෞද්ගලික කටයුත්තක් සඳහා පරිහරණය කිරීම, ඉතා බරපතල වරදක් ලෙස සළකනු ලබන අතර, එයට වරදකරු වන තැනැත්තෙකුට විරුද්ධව නඩු පැවරීමට සහ විනායානුකූලව කටයුතු කිරීමට ඉඩ තිබේ.

අරමුදල් අනිසි පරිහරණය

## 3. දායක මුදල් එකතු කිරීම

3.1 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු විසින් පොදු පුන්‍ය කටයුත්තන් සඳහා පහළ තනතුරු දරන සේවකයින්ගෙන් අරමුදල් එකතු කිරීමට ක්‍රියාකාරී ලෙස සහභාගි නොවිය යුතු

පහළ තනතුරු වල තැනැත්තන්ගෙන් දායක මුදල් එකතු කිරීම තහනම් වේ

අතර, එවැනි කටයුත්තක් සඳහා තම සේවා ස්ථානයේ දායක මුදල් එකතු කිරීමට, තම පවුලේ සාමාජිකයන් හට ද ඉඩ නොදිය යුතු ය.

3.2 ඉහළ නිලධාරීන්ට පිරිනැමීම සඳහා ගත්, සේවා සම්මාන, ප්‍රදාන සහ පරිත්‍යාග වෙනුවෙන් යන වියදම් පියවා ගැනීමට පහළ තනතුරු වල සේවකයින්ගේන් මුදල් එකතු කිරීම තහනම් වේ.

ඉහළ නිලධාරීන්ට ත්‍යාග පිරි නැමීමට

3.2.1 නිලධාරියකු තම සේවා කාලය අවසන් කරන අවස්ථාවක දී, අදාල පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ, උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනක ප්‍රධාන විධායක නිලධරයාගේ අනුමැතිය ඇතිව පමණක් මෙම රීතිය ලිහිල් කළ හැකි ය.

සේවය අවසන් කරන අවස්ථාවක දී

3.3 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු හට ත්‍යාග පිරි නැමීම සඳහා දායක මුදල් එකතු කිරීම සහ ආධාර පත්‍ර සංසරණය කිරීම සපුරා තහනම් වේ.

යම් තැනැත්තෙකු හට ආධාර පිණිස මුදල් එකතු කිරීම

## 4. **ණය බර නිසා ඇතිවන අපහසුතාවය**

4.1 කුමන හේතුවක් මත වුව ද ඇතිවන්නා වූ ණය බරින් පෙළීම, යම් සේවකයකුගේ කාර්යක්ෂමතාවය හීන කරන්නා වූ සාධකයක් ලෙසත්, එවැනි ණය බර ඇති නොවූයේ නම්, ඔහුගෙන් ලැබිය හැකිව තිබූ සේවයේ වටිනාකමට වඩා අඩුවීමට හේතුවක් ලෙසත් සැලකේ.

ණය බර කාර්යක්ෂමතාවය අඩු වීමට හේතුවක් ලෙස සැලකේ

4.2 එබඳු අපහසුතාවයක්, මුදල් නාස්තියක්, අවිචක්ෂණභාවයක් හෝ වෙනත් දෝෂාරෝපනය කළ යුතු හේතුවෙක් නිසා ඇතිවූයේ නම්, එය කොමිෂන් සභාවේ ද / උසස් අධ්‍යාපන ආයතනයේ ද / විද්‍යායතනයේ ද, තමන් දරන තනතුරේ ද හොඳ නමට සහ ඔහු කෙරෙහි තැබිය හැකි විශ්වාසවන්තභාවයේ ප්‍රමාණයට ද හානිදායක කරුණක් ලෙස සැළකේ.

කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක කීර්තිනාමය

4.2.1 මෙවැනි ආකාරයකින් කටයුතු කිරීම හේතුවෙන් මුදල් අපහසුතාවයට පත් තැනැත්තෙකු, තම සේවා කාලයට අනුව ලැබිය හැකි උසස් කිරීම්, වෙනත් පත්කිරීම් හෝ වැටුප් වැඩි කිරීම් ආදිය ලබා ගැනීමට තමන්ට තිබූ අයිතිය තහවුරු කරන ගෞරවනීය තත්ත්වය අහිමි කරගත් අයකු ලෙස සැළකේ.

පත් කිරීම්, උසස් කිරීමේ, වැටුප් වැඩි කිරීම් වලට බලපෑ හැකි ය

4.2.2 යම් තැනැත්තෙකු මෙහි විස්තර කොට ඇති ආකාරයේ උග්‍ර ණය බර සහිත තත්ත්වයකට පත්වී ඇති බව දැනගත් විට, මෙහි ඉහත සඳහන් ආකාරයට හෝ එක් එක් අවස්ථාවන්ට වඩාත් සුදුසු යැයි හැඟෙන ආකාරයට අදාල ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.

උග්‍ර අවස්ථා

4.3 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු, ණයගැති වීම නිසා අත් අඩංගුවට පත්වීම හෝ නඩු තීන්දුවක් මඟින් වස්තු භංගත්වයට පත් වූවකු බවට නිගමනය කරනු ලැබුවහොත් හෝ ණය හිමියන් සමඟ සංසාධනයකට එළඹ ඇත්නම් හෝ, ඒ බව අදාල තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනය ප්‍රධාන විධායක නිලධාරයාට දැන්විය යුතු ය. — ණය වීම නිසා අත් අඩංගුවට පත්වීම

4.3.1 ඉහතින් සඳහන් පරිදි, විෂමාචාරය යටතේ ඇති විනය රීති වලට අනුව, ඔහුට විරුද්ධව කටයුතු කොට, ඔහුගේ සේවය තාවකාලිකව අත්හිටුවිය යුතු අතර, ලැබී ඇති තොරතුරු විභාග කිරීමෙන් අනතුරුව, ඔහු මෙම දුෂ්කරතාවයට පත්ව ඇත්තේ යම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා ද යන්න සහ එසේ නොමැතිව කිසියම් නාස්තිකාරී ක්‍රියාවක් හේතුවෙන් හෝ සාපරාධී අදූරදර්ශීභාවය නිසා නොවන බව හෙළිදරව් වූ විට සහ වරදේ බරපතලකම ලිහිල් කිරීමට හේතු ඇති බවට පෙනී යන්නේ නම් මිස ඔහු නැවත සේවයේ නො පිහිටු විය යුතු ය. — විෂමාචාරය

4.3.2 තමන් ණය ගැතිවීම නිසා හෝ වස්තු භංගත්වයට පත්වීම නිසා තමන්ට එරෙහිව නිතීමය ක්‍රියාමාර්ගයන්ට එළඹී ඇති බව, යම් තැනැත්තෙකු නියමිත බලධාරීන් හට නොදැන්වීම, එම තත්ත්වය දැනගත් විට නැවත සේවයට පත්කිරීමට අපේක්ෂාවක් තබාගත නොහැකි ආකාරයෙන් සේවයෙන් පහ කිරීමට හේතුවක් වනු ඇත. — නො දැන්වීමේ ප්‍රතිවිපාක

## 5. රාජකාරී තොරතුරු මහජනයාට සැපයීම

5.1 කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා / විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපන පිළිබඳ ආයතනයක අධ්‍යක්ෂවරයා හෝ උපකුලපතිවරයා / විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා හෝ ඔවුන් විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු විසින් හැර, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු කිසිඳු තැනැත්තෙකු විසින්, උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳව හෝ එහි පරිපාලනමය කරුණු පිළිබඳව කිසිම නිල තොරතුරක්, පුවත්පතකට, රූපවාහිනියට, ගුවන් විදුලියට හෝ මහජනයාට ලබා නොදිය යුතු ය. — විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති සහ පරිපාලන කරුණු දැනුම් නොදිය යුතු ය

5.2 කොමිෂන් සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා / උසස් අධ්‍යාපනය පිළිබඳ විද්‍යායතනයක, ආයතනයක හෝ මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා හෝ ඔවුන් විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධරයකු විසින්, එම කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ / එහි අනුබද්ධිත, අනුයුක්ත ආයතනයන්හි, මහජනයාට ප්‍රයෝජනවත් විය හැකි හෝ දැනගත යුතු යම් තොරතුරක් ලබාදිය හැකි ය. — මහජනයාට ප්‍රයෝජනවත් විය හැකි තොරතුරු

5.2.1 මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා විසින් තම මණ්ඩපයට අදාල එහෙත් මහජනයාට වැදගත් වේ යැයි හැගෙන තොරතුරු මහජනයාට ලබාදිය හැකි ය.

**මණ්ඩපයක තොරතුරු**

5.3 මහජනතාවට ලබාදෙන තොරතුරු සාමාන්‍යයෙන් මුද්‍රිත මාධ්‍යය මඟින් හෝ විද්‍යුත් මාධ්‍යය හරහා ලබාදිය යුතු වේ.

**මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය**

5.4 යම් තොරතුරක්, සත්‍ය කරුණු හෝ සංඛ්‍යා ලේඛන මගින් අනිවාර්යයෙන් පිළිගැනුණු අවස්ථාවක දී හැර, යම් තැනැත්තකුගේ පෞද්ගලික මතය මත පදනම් ව ඒවා ප්‍රසිද්ධ නො කළ යුතු ය.

**සත්‍ය කරුනු / සංඛ්‍යා ලේඛන මත පදනම්ව පමණක්**

5.5 යම් තොරතුරක්, සත්‍ය සිද්ධීන් හෝ අදාල සංඛ්‍යා ලේඛන මඟින් තහවුරු කොට ඇති අවස්ථාවක දී වුව ද, එම තොරතුරු ප්‍රසිද්ධ කිරීම මඟින්, රජය හෝ කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් හෝ අපහසුතාවයකට පත් වේ නම්, එම සම්පූර්ණ තොරතුරම හෝ එයින් කොටසක් හෝ ප්‍රසිද්ධ කිරීමෙන් වැළකිය යුතුවේ. යම් සැක සහිත අවස්ථාවක දී, ඒ පිළිබඳව කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා විමසිය යුතු වේ.

**රජය හෝ උසස් අධ්‍යාපන ආයතන අපහසුතාවයට පත්වීම**

5.6 කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ ලේකම්වරයා විසින් / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා විසින් / විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා විසින් / මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා විසින් / උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක, මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔවුන් විසින් බලය පවරා ඇති වෙනත් නිලධරයකු විසින්, මහජනතාවට හෝ මුද්‍රිත / විද්‍යුත් මාධ්‍යයකට යම් තොරතුරක් ලබාදෙන විට, එම නිලධාරියා විසින් නිල වශයෙන් ලබා දෙන තොරතුරක් ලෙස ලබාදිය යුතු ය.

**නිල වශයෙන් ලබා දෙන කරුණු**

5.7 ඉහත 5.1 සහ 5.2 උපඡේදයන්හි සඳහන් නිලධරයන් හැර වෙනත් කිසිදු තැනැත්තෙකු, ඔහු විසින් තම රාජකාරියෙහි යෙදී සිටිය දී සොයාගත් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම ඡේදයෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ එම කරුණු සම්පූර්ණයෙන් හෝ එයින් කොටසක් ගැන මුද්‍රිත හෝ විද්‍යුත් මධ්‍යයක් මඟින් පවත්වනු ලබන සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වීමට හෝ එකී මධ්‍යයන් සමඟ ගනුදෙනු කිරීමට අවසර නොදිය යුතු ය.

**මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය සමඟ සම්මුඛ සාකච්ඡා**

5.8 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු යම් තැනැත්තකු, ඉහත කී ආයතනයන් සමඟ ඇති කරගත් නිල ලිපි ගනුදෙනු, කොමිෂන් සභාවේ සභාපතිවරයගේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාගේ පූර්ව අනුමැතියකින් තොරව, කුමන හෝ පුවත් පතක පළ කිරීම සඳහා නො යැවිය යුතු ය.

**නිල ලිපි ගනුදෙනු**

5.9 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු යම් තැනැත්තෙකු, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව, කිසිඳු පුවත්පතක කතෘ ධූරය දැරීමට හෝ පුවත්පතක කළමණාකාරීත්වයට හෝ සෘජුව හෝ අනියම් ලෙස සම්බන්ධවීමට කටයුතු නො කළ යුතු ය. — පුවත්පතක කතෘ ධූරය

## 6. මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය

6.1 යම් තැනැත්තෙකු රාජකාරියෙහි යෙදී සිටින විටක දී හෝ රාජකාරී ස්ථානයේ හෝ වෙන යම් රජයේ ආයතන පරිශ්‍රයක මත්පැන් හෝ මත් ද්‍රව්‍යයක් භාවිතා කොට, වෙරිමතින් සිටීම හෝ එසේ පානය කිරීම නිසා මත්පැන් ගඳ ආඝ්‍රානය වීම හෝ බරපතල විෂමාචාරයක් සිදුකල අයෙකු ලෙස සැලකේ. එවැනි අවස්ථාවක දී, ආයතන ප්‍රධානියා විසින් හෝ විනය බලධරයා විසින්, එම තැනැත්තාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට හැකියාව තිබේ. (XIX පරිච්ඡේදයේ, 2.2.6 උපඡේදය බලන්න.) — මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතය

6.2 මත්පැන් පානය කොට සිටීම හෝ මත්පැන් ගඳ ආඝ්‍රානය වීම යන වරදවල් හේතුවෙන් පවත්වන විනය පරීක්ෂනයක දී, යම් තැනැත්තෙකුගේ සදොස්භාවය ඔප්පු කිරීම සඳහා විධායක ශ්‍රේණියක නිලධාරීන් දෙනෙකු විසින් දෙනු ලබන සාක්ෂි ප්‍රමාණවත් වන අතර, ඒ සම්බන්ධයෙන් පවත්වන අදාල විධිමත් විනය පරික්ෂණයේ දී එම තැනැත්තා වරදකරුවකු කරණු ලැබුවේ නම්, විනය බලධරයා විසින්, වරදකරු කරනු ලැබූ තැනැත්තා සේවයෙන් පහ කිරීමට හෝ XIX පරිච්ඡේදයේ 4.1.2 උපඡේදයෙහි සඳහන් පරිදි වෙනත් බරපතල දඬුවමක් ලබාදීමට හෝ යටත් වේ. — විධායක නිලධාරීන් දෙදෙනෙකුගේ සාක්ෂි ප්‍රමාණවත් ය

6.3 දෙවන වතාවකදීත්, ඉහත 6.2 උපඡේදයෙහි සඳහන් වරදක් සම්බන්ධයෙන් වරදකරු වන තැනැත්තකු, අනිවාර්යයෙන්ම සේවයෙන් පහකල යුතු ය. — අනිවාර්ය සේවයෙන් පහ කිරීම

6.4 ඉහත 6.1 උපඡේදයෙහි සඳහන් කොට ඇති ආකාරයට, මත්ද්‍රව්‍යයක් භාවිතා කොට ඇති බවට සැක කරන තැනැත්තෙකු මත්ද්‍රව්‍යයක් භාවිතා කොට ඇති බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් හෝ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු විසින් හෝ තහවුරු කළ යුතු වේ. එවැනි තැනැත්තෙකුට එරෙහිව පවත්වනු ලබන විධිමත් විනය පරික්ෂණයක දී වරදකරු වුවහොත්, එම තැනැත්තා අනිවාර්යයෙන් සේවයෙන් පහකල යුතු ය. — රජයේ වෛද්‍ය නිලධාරියකු / අධිකරණ වෛද්‍ය නිලධාරියකු සනාථ කිරීම